# නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය - මුරුතවෙල

வதிவிட திட்ட முகாமையாளர் காரியாலயம் – முறதவெல

**Resident Project Management Office – Muruthawela**

**වාරිමාර්ග කළමනාකරණ අංශය**
நீர்ப்பாசன முகமைத்துவ பிரிவு
**Irrigation Management Division**
**වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය**
நீர்ப்பாசனம் மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
**Ministry of Irrigation & Water Resources Management**

වීරකැටිය
வறகாட்டிய
Weraketiya.

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref No - 23/3/28 | ඔබේ අංකය / உமது இல. / Your Ref No | දිනය / திகதி / Date - 2018.02. |

*<u>ව්‍යාපාර කලමනාකරණ කමිටු රැස්වීම පෙබරවාරි මාසය</u>*

*<u>මුරුතවෙල ව්‍යාපාරය</u>*

දිනය - 2018.02.06

ස්ථානය - මුරුතවෙල නේවාසික ව්‍යාපෘති කලමනාකරණ කාර්යාලය

වේලාව - පෙ.ව. 9.30

<u>සහභාගිත්වය</u>

*<u>රාජ්‍ය නිලධාරින්</u>*

01. කේ.ජයසිංහ මහතා - නේවාසික ව්‍යාපාර කළමනාකරු
02. කේ.එච්.එන්.එම්.කුමාර මයා - වාරිමාර්ග ඉංජිනේරු - ප්‍රා.වා.ඉ.කා. -වීරකැටිය
03. එච්.ටී.එස්. චාන්දනී මිය - ආයතන සංවර්ධන නිලධාරී - මුරුතවෙල ව්‍යාපාරය
04. ජේ.එස්.ඩෙල්කානි මිය - සංවර්ධන නිළධාරි- මුරුතවෙල ව්‍යාපාරය
05. ඩබ්ලිව්.ජී.ඒ.එන්. ලක්මාලි මිය - සංවර්ධන නිළධාරි- මුරුතවෙල ව්‍යාපාරය
06. ඊ.ඒ.ඒ. සංජීවනී මිය - සංවර්ධන නිළධාරි- මුරුතවෙල ව්‍යාපාරය
07. කේ.ටී. බන්දුසිරි මහතා - ඉංජිනේරු සහකාර - ප්‍රා.වාරි.ඉ.කා.වීරකැටිය
08. ඊ.වී.පී.ජේ. නිරංජනී මිය - තාක්ෂණික සහායක - ප්‍රා.වාරි.ඉ.කා.වීරකැටිය
09. ඩී.ආර්.ඩී. අතුල මයා - ස්ථානභාර කෘෂිකර්ම උපදේශක - අඟුණකොලපැලැස්ස
10. එම්.සී.පී. කුමාර මයා - සංවර්ධන නිළධාරි - ප්‍රා.වාරි.ඉ.කා.වීරකැටිය
11. එල්.එස්. හෙට්ටිආරච්චි මයා - සංවර්ධන නිළධාරි - ප්‍රා.වාරි.ඉ.කා.වීරකැටිය
12. ජේ.එච්.ජේ. ප්‍රසන්න මයා - කෘෂිකර්ම උපදේශක - මැදමුලන
13. ඩබ්ලිව්.කේ.ඒ.එල්. ප්‍රියන්ත මයා - කෘෂිකර්ම උපදේශක - අත්තනායාල

<u>ගොවි සංවිධාන නියෝජිත මහතුන්</u>

01. විජේරත්න කළුආරච්චි මයා - යාය01 උළකපුහේන භාණ්ඩාගාරික
02. එල්.ඒ. ආරියපාල මයා - යාය 01 රුහුණු ලේකම්
03. ජයසේන විදානපතිරණ මයා - යාය 01 වීර 02 ලේකම්
04. පියදාස විජේසිංහ මයා - යාය 01 සියඹලහැද්දැව සභාපති
05. එම්.කේ. ගුණපාල මයා - යාය 02 ඩී 01 පහළ සභාපති
06. ජේ.එල්.ඒ. නිහාල් මයා - යාය 02 ඩී 02/03 සභාපති

07. ජිනදාස මොහොට්ටි මයා - යාය 02 ඩී 02/03 භාණ්ඩාගාරික
08. ටී. ජයතිස්ස මයා - යාය 02 ඩී 05 සභාපති
09. ආර්.කේ. වීරපාල මයා - යාය 02 ඩී 06 සභාපති
10. ජී. සයිමන් මයා - යාය 02 ඩී 07 සභාපති
11. එච්.ජී. රංජිත් ලක්මාල් මයා - යාය 02 ඩී 08 සභාපති
12. එම්.ඒ. පියදාස මයා - යාය 02 ඩී 09 සභාපති
13. වී.එච්. සුගත් ප්‍රියංකර මයා - යාය 02 ඩී 09 ලේකම්
14. ඩබ්ලිව්.එම්.ආරියදාස මයා - යාය 03 ඩී 02 ලේකම්
15. ටී.කේ. ප්‍රේමවර්ධන මයා - යාය 03 ඩී 03 සභාපති
16. උපසේන අමරවීර මයා - යාය 03 ඩී 04 භාණ්ඩාගාරික
17. ඩබ්ලිව්.පී. කරුණානායක මයා - යාය 03 ඩී 06 භාණ්ඩාගාරික
18. ජී.ඒ. ගුණපාල මයා - යාය 03 ඩී 07 ලේකම්
19. ඩබ්ලිව්.එල්.වීරසිංහ මයා - යාය 03 ඩී 08 ලේකම්
20. ටී.කේ. ආරියදාස මයා - යාය 03 ඩී 08 භාණ්ඩාගාරික
21. ජී.ජී. ප්‍රේමතිලක මයා - යාය 03 ඩී 09 සභාපති

න්‍යාය පත්‍රානුකූලව ආගම සිහිකිරීමෙන් අනතුරුව නේ.ව්‍යා.කළ. විසින් පැමිණ සිටි පිරිස පිලිගන්නා ලදී. අනතුරුව පසුගිය වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදි. වාර්ථාවේ අඩුපාඩු පෙන්වා දෙමින් යායා 03 ඩී 02 ලේකම් ඩබ්ලිව්.එම්. ආරියදාස මහතා ප්‍රකාශ කර සිටියේ යාය 03 ඩී 01 FC 44 ඇල පුනරුත්ථාපනය අඩුපාඩු සම්බන්ධව ප්‍රකාශ කලද ඒවා වාර්ථාවට ඇතුලත් වී නොමැති බවයි.තවද යාය 03 ඩී 03 FC 55 සහ ඩී 03 ප්‍රධාන ඇල බෙන් බහින ස්ථාන සම්බන්ධයෙන්ද සඳහන් වීමක් නොමැති බවයි. ඉන්පසු යාය 01 වීර 01 ගොවි සංවිධානයේ සභාපතිවරයාගේ බිරිදගේ අභාවය වෙනුවෙන් ව්‍යාපාර කමිටුවේ ශෝකය ප්‍රකාශ කර සිටියේය.

<u>ආයතන සංවර්ධන කටයුතු - (ආයතන සංවර්ධන නිළධාරි - එච්.ටී.එස්.චාන්දනී මිය.)</u>

| කාරණය | තීරණය | වගකීම |
|---|---|---|
| කාරක සභා රැස්වීම් පැවැත්වීම | සෑම මසකම කාරක සභා රැස්වීම් පැවැත්වීම | සංවර්ධන නිලධාරී |
| විගණනය අවසන් කිරීම | පලමු කාර්තුව තුල විගණනය අවසන් කිරීම | සං.නි. |
| ඒකාබද්ධ ගොවි සංවිධානයේ කාරක සභා රැස්වීම් පැවැත්වීම විගණනය අවසන් කිරීම | සෑම මසකම කාරක සභා රැස්වීම පැවැත්වීම / විගණනය අවසන් කිරීම | ආ.සං.නි. |
| ඇලවල් නඩත්තු කටයුතු | කන්නයට දෙවරක් ඇලවල් සුද්ද කිරීම | ගො.සං සං.නි. |

<u>වාරිමාර්ග කටයුතු - වාරිමාර්ග ඉංජිනේරු (කේ.එච්.එන්.එස්.කුමාර මයා )</u>

දැනට ජලාශයේ ජල ධාරිතාවය අක්කර අඩි 32920 ක් පමණ වන බව ඉංජිනේරුවරයා පවසා සිටියේය. කන්නයට වගා නොකිරීම නිසා පුනරුත්ථාපන කටයුතු සිදුකිරීමට අපහසු වී ඇති බවත් එය ව්‍යාපාරයට දැඩි පාඩුවක් බවත් එම නිසා පුනරුත්ථාපන කටයුතු ද කෙසේ හෝ කරගත යුතු බවද පවසා සිටියේය.යාය තුන

කොටසට ජලය ගෙනයන ප්‍රධාන ඇල කැඩීයාම නිසා ප්‍රමාණවත් ජලය ලබාදීමට අපහසුවන බවත් ගොවි සංවිධාන අභ්‍යන්තර ජලය බෙදාගැනිම අනිවාර්යෙන් සිදුකල යුතු බවත් ඒ සඳහා ගොවි සංවිධාන සක්‍රියව මැදිහත්විය යුතු බවත් පවසා සිටියේය.යාය 01 කොටසේ crip ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීමට සියළුම කොන්ත්‍රාත් කොන්ත්‍රාත් කරුවන්ට පිරිනමා ඇති බවත්, ඊලග කන්නය අප්‍රේල් 25 න්පසුව පටන් ගන්නා බවත් පැවසීය.

| ඉදිරිපත් කිරීම | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| යාය 03 ඩී 03 සභාපති ටී.කේ. ප්‍රේමවර්ධන මයා | FC 43 කුඹුරු ලගින් බෙනයක් බසින බැවින් ජලය අපතේ යාම | අවශ්‍ය කටයුතු සඳහා JCB යන්ත්‍රය ලබාදීම | වා.දෙ |
| ඉංජිනේරු සහකාර කේ.ටී. බන්දුසිරි මහතා | යාය 03 න් පහළ ගොවි සංවිධාන 05 මහවැලි ජලය බෙදාගැනීම | ඩී 05/06, ඩී 07/08 , ඩී 09 ලෙස කාණ්ඩ 03 යටතේ ජලය බෙදාගැනීම | වා.දෙගො.සං |
| යාය 03 ඩී 09 සභාපති ජී.ජී. ප්‍රේමතිලක මයා | මුර ක්‍රමය ක්‍රියාත්මක කිරීමට ඇලවල්වල ගේට්ටු සකස් කර දිය යුතුයි. | ගේට්ටු නොදා වුවද ජලය බෙදාගැනිමේ ක්‍රමවේදයක් ගොවි සංවිධාන විසින් සකස් කරගත යුතුයි. | ගො.සං |
| යාය 02 ඩී 09 සභාපති වී.එච්. සුගත් ප්‍රියංකර මයා | ඩී 09 ප්‍රධාන පාරට පස් දමා සකස් කරදීම<br>FC 134 ආරම්භක ඇල පැති බැම්මක් සකස් කරනවාද යන්න<br>යාය 02 ඩී 09 ගොවි සංවිධානයට යාබදව පිහිටි කැකුණයාය පොල අසලින් අනවසර බට දමාගෙන ජලය ලබාගන්නා බවත්, ඔවුන් ගොවි සංවිධානයට බඳවාගෙන විධිමත් ක්‍රමයට ජලය ලබාදීම. | JCB යන්ත්‍රය ලබාදීම<br>ඇස්තමේන්තුව පරීක්ෂාකර බලා දැනුවත් කිරීම<br>ක්‍ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර තීරණය ගැනීම | වා.දෙ<br>වා.දෙ<br>වා.දෙ. |
| යාය 02 ඩී 02/03 සභාපති ජේ.එල්.ඒ. නිහාල් මයා | ඩී 02/03 ප්‍රධාන ඇල දෙපැත්තේ පස් දමා ගොඩකල යුතුයි<br>FC 41 ඇල පාර මට්ටමට සකස් කරදෙන ලෙස ඉල්ලීය. | කලින් කරන ලද ව්‍යාපෘතියක් බව පැවසීය. | |
| යාය 03 ඩී 08 ලේකම් ඩබ්ලිව්.එල්.වීරසිංහ මයා | මහවැලි දොර ලග ජල මට්ටම බලා ගැනීම සඳහා ජල මාපාංකයක් සකස් කල යුතුයි | කඩිනමින් ජල මාපාංකයක් සවි කිරීම | වා.දෙ |
| යාය 03 ඩී 06 භාණ්ඩාගාරික ඩබ්ලිව්.පී. කරුණානායක මයා | යාය 03 ඩී 06 ප්‍රධාන ඇල සම්පූර්ණයෙන්ම කොන්ක්‍රීට් කරනවාද යන්න | 300m කොන්ක්‍රීට් කරන බවත්,ඇලේ ජලය පවතින නිසා වැඩ නවතා ඇති බැවින් ගොවි සංවිධාන | ගො.ස. |

| | | | |
|---|---|---|---|
| | | මැදිහත්වී ජලය දින කිහිපයකට නවතා දිම. | |

__කෘෂිකර්ම කටයුතු - කෘෂිකර්ම උපදේශක (ඩබ්ලිව්.කේ.ඒ.එල්. ප්‍රියන්ත මයා )__

දැනට වී වගාවේ දිලීර, මයිටා සහ කීඩෑ හානිය පවතින බවත් ඒ සඳහා සල්ෆර් දැමීම ප්‍රමාණවත් නොවන බවත් ඒ සඳහා ඊට වඩා සැර කෘමිනාශකයක් භාවිතා කලයුතු බවත් පැවසීය. කීඩෑ හානිය සඳහා ගොවීන් එකවිට කෘමිනාශක භාවිතා කිරීම සුදුසු බවත්, දිලීර හානිය සඳහා ජලය කඩා පාලනය කරගත නොහැකි නම් කෘමිනාශක යෙදීම සුදුසු බවත් බවසා සිටියේය.

__යාය 02 ඩී 07 ගොවි සංවිධානයේ සභාපති - (ජී. සයිමන් මයා)__

පසුගිය දිනක ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා භාණ්ඩ ලබාදීමක් සිදුකර ඇති බවත් ඒවා සුදුසු පුද්ගලයන්ට ලබාදීමක් සිදු නොවී ඇති බවත් ඒවා කුමන පදනමක් යටතේ සිදුකලාද යන්න විමසා සිටියේය.

ඊට පිලිතුරු දෙමින් කෘෂිකර්ම උපදේශක ප්‍රියන්ත මහතා පවසා සිටියේ එවැනි වැඩසටහනක් පැමිණි විට ගොවි නියෝජිතයින් දැනුවත් කරන බවත් ඔවුන් නම් කරන ගොවීන්ට එම ද්‍රව්‍ය ලබාදීමක් සිදුකරන බවත්, එම ද්‍රව්‍ය ලබාදීමේ ගැටළුවක් පවතී නම් ඒ පිලිබඳව ලිඛිතව ලබාදෙන ලෙසත් වෙනත් ක්‍රමයක් පවතීනම් එයද යෝජනා කරන ලෙසත් ඉල්ලා සිටියේය.

__කෘෂිකර්ම කටයුතු - කෘෂිකර්ම උපදේශක (ජේ.එච්.ජේ. ප්‍රසන්න මයා )__

දැනට පවතින කාලගුණික තත්වය සමග කීඩෑ හානිය වැඩිවන බවත් ගොවීන් කැඳවා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වුවද ඒවාට සම්බන්ධවන ප්‍රමාණය අඩු බවත් ඉදිරියේදී තාක්ෂණික පුහුණු ලබාදීමට අපේක්ෂා කරන බවත්ය. තවද ගොවිජනසේවා මධ්‍යස්ථානය හරහා ලබාදෙන උපකරණ ඉල්ලීම් කිරීමේ පොතක් පවතින බවත් අවශ්‍ය පුද්ගලයින්ට ඒ හරහා ඉල්ලීම් කිරීමට හැකි අතර එහි සඳහන් කරන අනුපිලිවෙලට උපකරණ ලබාදීම සිදුකරන බවත් 50% ආධාර යටතේ උපකරණ ඉල්ලීම් කරන අය පසුව ඒවා නොගැනීම නිසා අපහසුතාවයට පත්වන බව පවසා සිටියේය. භාවිතයට නුසුදුසු කෘමිනාශක විකුණන වෙලදසැල් වැටලීමක් සිදුකරන බවත් එවැනි වෙලදසැල් පවතීනම් ඒ පිලිබඳව දැනුවත් කරන මෙන්ද, රසායනික පොහොර භාවිතා කරන ගොවීන් කාබනික ගොවීන් බවට පත් කිරීමේ වැඩසටහන යටතේ කාබනික පොහොර භාවිතා කරන ගොවීන් තෝරාගෙන ඇති බවත් ඉදිරියේදී ඔවුන්ට උපකරණ ලබාදීමක් සිදුකරන බවත් පැවසීය.

__නේවාසික ව්‍යාපෘති කළමනාකරු - කේ.ජයසිංහ මයා__

ව්‍යාපාර කමිටු රැස්වීම සෑම මසකම පලමුවන අඟහරුවාදා පැවැත්වීමේදී ක්ෂේත්‍ර නිලධාරීන්ට පැමිණීමේ ගැටළුවක් පවතින බවත් එම නිසා ඒ වෙනුවට සෑම මසකම පලමුවන සතියේ බ්‍රහස්පතින්දා දිනය යොදා ගන්නා බවත් පවසා සිටියේය.ව්‍යාපාර කමිටු ලේකම්වරයාගේ ස්තුති කථාවෙන් පසුව සභාවේ වැඩ කටයුතු නිම විය.

......................................

කේ.ජයසිංහ,
නේවාසික ව්‍යාපෘති කළමනාකාර,
මුරුතවෙල මහා වාරිමාර්ග ව්‍යාපාරය.

..............

ටී.ජයතිස්ස,
ලේකම්.

පිටපත්:-
අධ්‍යක්ෂ/ වාරිමාර්ග කළමනාකරණ අංශය - කා.දැ.ස.